# රට හදන සෞභාග්‍යයේ දැක්ම
# ඔබට රටක් - රටට හෙටක්
## බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව
## පුහුණු තනතුරු සඳහා බඳවා ගැනීම (පළමු අදියර)

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව "දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම" ප්‍රධාන සංකල්පයකි. ඒ සඳහා වන එක් තිරසාර හා ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල සිටින, අවම අධ්‍යාපන සුදුසුකම් සහිත සාමාජිකයන්ට, විධිමත් වෘත්තීය පුහුණුවක් ලබා දීමෙන් පසු රජයේ ස්ථිර රැකියා ලබා දීම අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමු වී ඇති වැඩසටහනකි.මෙම රැකියා ලබා දීම මගින් ඔවුන් ස්ථාවර ආදායම් ලබන්නන් බවට පත් කර, එම පවුල් දිළිඳුබවින් මුදවා ගැනීම සහ එම ශ්‍රම බලකායේ නිපුණතා සමෘද්ධිමත් රටක් ගොඩනැගීමේ කාර්යයට සඵලදායී ලෙස දායක කර ගැනීම සඳහා රැකියා ලක්ෂයක් (100,000ක්) ලබා දීම පිණිස බඳවා ගැනීමේ මූලික කටයුතු 2020 ජනවාරි මස 20 සිට ආරම්භ කරනු ඇත.

මේ සඳහා පිහිටුවා ඇති බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින් විධිමත් ක්‍රමවේදයකට හඳුනාගන්නා රැකියාලාභීන්ට මාස හයක (06) රැකියා පුහුණුවක් ලබා දේ.මෙම නිවේදනයේ සඳහන් පුහුණු ක්ෂේත්‍ර අතරින් තමා පදිංචි ප්‍රදේශවල පවතින රැකියා අවස්ථාවලට ගැලපෙන වෘත්තීය පුහුණුවක් ලබා දීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **සුදුසුකම් :**

   අ. අ.පො.ස.(සා.පෙළ) සමත්වීමේ මට්ටමට වඩා පහළ මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත වීම. (අධ්‍යාපන සුදුසුකම් අවම අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

   ආ. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා ~~40~~ 45ට නොවැඩි වීම (වයස අවුරුදු 35ට අඩු අයදුම්කරුවන්ට ඉහළ ප්‍රමුඛතාව ලැබෙන අතර වයස අවුරුදු 35-~~40~~ 45 අතර අයදුම්කරුවන්ට ඊළඟ ප්‍රමුඛතාව හිමි වේ.)

   ඇ. සමෘද්ධි සහනාධාර ලැබීමට සුදුසු එහෙත් නොලබන පවුලක රැකියා විරහිත සාමාජිකයකු වීම හෝ

   ඈ. සමෘද්ධි සහනාධාර ලබන පවුලක එහෙත් රැකියා විරහිත සාමාජිකයකු වීම හෝ

   ඉ. වයස්ගත, රෝගාතුර දෙමව්පියන් හෝ ආබාධිත සාමාජිකයන් සිටින පවුලක රැකියාවක් නොමැති සාමාජිකයකු වීම.

   ඊ. අයදුම් කරන ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

2. **පුහුණුව සඳහා තෝරා ගැනීම :**

   2.1 එක් පවුලකින් ඉහත අංක 1 හි සඳහන් සුදුකම් සපුරා ඇති එක් ඉල්ලුම්කරුවෙකු ගැන පමණක් සලකා බලනු ලැබේ.

   2.2 අයදුම්කරුවන් පදිංචි ගම ආශ්‍රිත ප්‍රදේශවල පවතින රැකියා අවස්ථා සහ අයදුම්කරුවන් ඉල්ලා ඇති පුහුණු ක්ෂේත්‍ර සියල්ලම සැලකිල්ලට ගෙන අදාළ වෘත්තීය පුහුණුව තීරණය කරනු ලැබේ.

   2.3 තමා පදිංචි ප්‍රදේශය තුල හෝ ආසන්න ප්‍රදේශවල ඇති පුහුණු මධ්‍යස්ථානවලදී මෙම පුහුණුව සිදු කරනු ලැබේ.

   2.4 සාර්ථක පුහුණුවකින් පසු පදිංචි ප්‍රදේශයේ හෝ ආසන්න ප්‍රදේශවල රැකියාවල නිරත කරනු ලැබේ.

## 3. වැටුප් හා දීමනා :

මාස හයක (06) ක අඛණ්ඩ පුහුණු කාලය තුළ මසකට රුපියල් 22,500/=ක දීමනාවක් ගෙවනු ලැබේ. සාර්ථක පුහුණුව නිම කිරීමෙන් පසු තමා පුහුණුව ලැබූ ක්ෂේත්‍රයට අදාළව, තමාගේ ස්ථිර පදිංචි ප්‍රදේශය තුල රජයේ අනුමත ප්‍රාථමික ශිල්පීය නොවන (PL I) වැටුප් සහ දීමනා හිමි රජයේ ස්ථිර තනතුරකට පත් වීමට පුහුණුලාභීන්ට අවස්ථාව ලැබේ. වසර 10ක සතුටුදායක අඛණ්ඩ සේවා කාලයක් සපුරාලීමෙන් පසු රජයේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබේ.

## 4. පුහුණුව සඳහා අදාළ ක්ෂේත්‍ර :

1. කෘෂි නිෂ්පාදන සහායක
2. සාත්තු සේවා, පවිත්‍රතා සේවා සහායක
3. ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක
4. ආපදා කළමනාකරණ සහායක
5. පරිසර කළමනාකරණ සහායක
6. අලෙවි සේවා සහායක
7. ප්‍රවාහන කටයුතු සහායක
8. පරිගණක, තොරතුරු තාක්ෂණ, දුරකථන ක්‍රියාකරු හා සන්නිවේදන සහායක
9. මත් ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක
10. අරක්කැමි, භෝජනාගාර සේවක හා බොජුන්හල් සහායක
11. තරු පංතියේ සංචාරක හෝටල්, බංගලා සහායක සහ උද්‍යාන අලංකරණ සහායක
12. ක්‍රීඩා ආයතන, කාය වර්ධන මධ්‍යස්ථාන සහායක, ක්‍රීඩාංගන, පිහිනුම් තටාක සහායක සහ ජීවිතාරක්ෂක සහායක
13. වඩු කාර්මික හා වඩු සහායක
14. ඇඳුම් මැසීම
15. පෙදරේරු හා පෙදරේරු සහායක
16. රූපලාවන්‍ය මධ්‍යස්ථාන සහායක
17. විදුලි කාර්මික හා විදුලි කාර්මික සහායක සේවා
18. රියදුරු හා රියදුරු සහායක
19. සත්ව පාලනය හා ධීවර කටයුතු සහායක
20. ඉන්ධන පිරවුම්හල් හා රථවාහන පිරිසිදු කිරීමේ සහායක
21. දැල් හා ධීවර ආම්පන්න අලුත්වැඩියා සහායක
22. අවි රහිත ආරක්ෂක නියාමක
23. පූර්ව ළමා විය සංවර්ධන සහායක
24. වෑද්දුම්කරු සහායක සහ ජලනල කාර්මික
25. ගෘහපාලක, සුභසාධන හා නඩත්තු

## 5. අයදුම්පත් :

සකස් කරන ලද අයදුම්පත කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ඔබ පදිංචි ග්‍රාම සේවා වසමේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2020.02.15** දින හෝ ඊට පෙර ඔබ පදිංචි ග්‍රාම සේවා වසමේ ග්‍රාම නිලධාරී වෙත භාර දිය යුතුය.